# ආයුධ බිම තිබ්බත් සටන් විරාම එපා

කොටි ත්‍රස්තවාදී සංවිධානයෙහි ඊනියා දේශපාලන අංශයෙහි නායකයා යැයි කියනු ලබන පුද්ගලයකු සටන් විරාම ගිවිසුමකට එළඹෙන ලෙස ලංකාණ්ඩුවට ආරාධනය කර ඇතැයි පැවසෙයි. කොටියා සැරසෙන්නේ කුමකට ද යන්න ඉතා පැහැදිලි ය. පරාජයේ එළිපත්තට පැමිණ ඇති කොටි ත්‍රස්තවාදීන්ට අද අවශ්‍ය වන්නේ තම ආයුධ හා පිරිස් ශක්තිය වැඩිකර ගෙන නැවතත් ලංකාණ්ඩුවේ හමුදාවන්ට අභියෝග කිරීම ය. ආණ්ඩුව ඔවුන්ට කිසිදු ඉඩක් දිය යුතු නො වෙයි. කොටි ඉල්ලීම කොන්දේසි විරහිතව ප්‍රතික්ෂේප කළ යුතු ය.

අප විටින් විට කියා ඇත්තේ කොටි සංවිධානයෙහි ඊනියා දේශපාලන නායකයා යන්න ම ව්‍යාජයක් බව ය. කොටි සංවිධානය ත්‍රස්තවාදී ක්‍රියාවල නිරත වෙයි. එසේ නිරත වන්නේ දේශපාලන වුවමනාවක් වෙනුවෙනි. කොටින්ගේ මූලික දේශපාලන වුවමනාව උතුරු හා නැගෙනහිර පළාත්වල වෙන ම රාජ්‍යයක් පිහිටුවීම ය. ඒ දේශපාලන වුවමනාව වෙනුවෙන් ඔවුහු අහිංසක සිංහල, දෙමළ හා මුස්ලිම් ජනයා මරති; ත්‍රස්තවාදී ක්‍රියාවල නිරත වෙති. ඔවුන් මේ දේශපාලනය කරගෙන යන්නේ නඩේසන් කෙනකුගේ නායකත්වයෙන් නො වෙයි. කොටින්ගේ දේශපාලන නායකයා ද ත්‍රස්තවාදී ක්‍රියාවල නායකයා ද ප්‍රභාකරන් හා ප්‍රභාකරන් පමණකි. සියළු දේශපාලන හා අනෙක් ප්‍රධාන තීන්දු ගනු ලබන්නේ ප්‍රභාකරන් නම් මිනීමරු ත්‍රස්තවාදී නායකයා විසිනි. නඩේසන් යනු හුදු ප්‍රකාශයෙකි.

ඉතා පැහැදිලිව අද ප්‍රභාකරන් පරාජය හමුවේ හුස්මක් ගැනීමට උපක්‍රමයක් සොයමින් සිටියි. බටහිරයන් විසින් මවනු ලබු ගෝනි බිල්ලෝ දෙදෙනෙක් වෙති. ප්‍රභාකරන් එක් ගෝනි බිල්ලෙකි. බටහිර බලවේග අනෙක් ගෝනි බිල්ලා වෙයි. රාජ්‍ය නොවන සංවිධානවල ආධාරයෙන් සහ ඊනියා ප්‍රබුද්ධයන් හා කසිකබල් ජඩමාධ්‍යවේදීන් යොදා ගනිමින් අපට පෙන්වනු ලැබුයේ කිසි දිනෙක පරාජය කළ නොහැකි කොටි සංවිධානයකි. ප්‍රභාකරන් යනු නාග රාජයකු ලෙසට මවා පෙන්විණි. ප්‍රභාකරන්ගේ යුද්ධ උපක්‍රම ගැන, ඒ ත්‍රස්තවාදී මිනීමරුවාගේ දක්ෂතාව ගැන පුවත්පත්වල සඟරාවල පිටුගණන් ලියැවිණි. ඊනියා ප්‍රබුද්ධ සම්මන්ත්‍රණවල රූපවාහිනී නාලිකා සංවාදවල කොටි ගැන කී කතා මගින් ජනතාව මන්දෝත්සාහි කරනු ලැබිණි. ඒ අතර හමුදාව අධෛර්යමත් කිරීමට හැකි සෑම කටයුත්තක් ම කෙරිණි. එහෙත් ප්‍රභාකරන් යනු ගැරඬියකු බව අද කවුරුත් දනිති.

කිසිදාක ඊනියා යුද්ධය (ඒ යුද්ධයක් නොව කොටි සංවිධානයට එරෙහිව කෙරෙන මෙහෙයුමකි. අප සෑමදාමත් කියා ඇති පරිදි මෙරට සිවිල් යුද්ධයක් හෝ වෙනත් යුද්ධයක් හෝ නැති බව දැන්වත් පැහැදිලි විය යුතු ය.) ජයගත නොහැකි යැයි පැවසූ ඊනියා ප්‍රබුද්ධයෝ කොටි පැරදවීය යුතු යැයි කී අය යුදවාදීන් ලෙස හැඳින්වූහ. මහා සංඝයා වහන්සේ බුද්ධ පුත්‍රයන් නොව යුද්ධ පුත්‍රයන් යැයි කී අය ද ඒ අතර වූහ. උන්වහන්සේලාට යුද්ධ පුත්‍රයන් යැයි ඊනියා ධර්මපාලලා කියවූයේ රූපසිංහ නමැත්තකු බටහිරින් ලත් මුදලින් බව එදත් අපි දැන සිටියෙමු. සිංහලයන්ට විරුද්ධව චිත්‍රපටි නිපදවන ඊනියා අසහාය සිනමාකරුවන් ඇතුළු විවිධ ප්‍රබුද්ධයන්ට එදත් අදත් බටහිරයන්ගෙන් සංතෝසම් ලැබෙන බව රහසක් නො වෙයි.

මේ අතර බටහිරයෝ තවත් මතයක් ජනතාවට කාන්දු කළහ. ඒ අනෙකක් නොව ඔවුන්ගේ තෙද බල ය. ඔවුන්ගේ අණසකට විරුද්ධව ඊනියා යුද්ධය පවත්වගෙන යෑමට ඉඩ නොදෙන බවට ඔවුහු විවිධාකාරයෙන් අපට ඇඟවූහ. තහංචි පැනවීම්, ආර්ථික සම්බාධක, ඊනියා මානව අයිතිවාසිකම් සහ අවසානයේ දී ආරක්ෂාකිරීමට ඇති අයිතිය (රයිට් ටු ප්‍රොටෙක්ට්) යන ව්‍යාජ අයිතියක් ද ගැන කතාකරමින් අප හාමතේ තබන්නට තමන් සූදානම් බව බටහිරයෝ ව්‍යංගයෙන් කීහ.

බටහිරයන් අද අප පාලනය කරන්නේ දැනුමේ බලයෙනි. ඊනියා දැනුම මත පදනම් වූ ආර්ථිකය ද (නොලේජ් බේස්ඩ් ඉකොනොමි) අප පාලනය කිරීම සඳහා යොදාගන්නා තවත් උප්පරවැට්ටි සංකල්පයක් පමණකි. මේ උප්පරවැට්ටිවලට පහසුවෙන් ම හසුවන්නෝ අපේ උගත්තු ය. බටහිරයන්ට අද වෙනත් ආකාරයකට කිරීමට හැකි ඉට්ටෙඩියක් නැත. ඔවුන්ට කෙළින් ම අභියෝග කරන විට කළ හැක්කේ කුමක් ද? බටහිරයන් තමන් සම්බන්ධයෙන් ද මවා පෑ නාග රාජයා ද තවත් ගැරඬියකු බව හෙළි වී ඇත.

© Prof. Nalin De Silva

සිම්බාබ්වේහි කුමක් සිදුවුව ද, ඒ ගැන අප එකඟ වුව ද නැත් ද, මුගාබේ ට විරුද්ධව බටහිරයන්ට කළ හැක්කේ කුමක් ද? තම ඇම්බැට්ට ජඩමාධ්‍යවේදීන් ලවා මුගාබේට ඇට්ටි හැලෙන්නට පත්තර පිටුවලින් හා රූපවාහිනී නාලිකාවලින් පහර දීම හැරෙන්නට බටහිරයන්ට කළ හැකි දෙයක් නැත. වැඩිම වුවහොත් ඔවුන්ට කළ හැක්කේ මුගාබේ මරාදැමීමට කටයුතු කිරීම පමණ ය. අද මියන්මාරයේ බටහිරයන්ට කිසිම ඇඟිලිගැසීමකට ඉඩ නො දෙයි. පසුගිය ගංවතුර සමයේ දී ද බටහිරයන් රට තුළට වද්දා නොගැනීමට මියන්මාර ආණ්ඩුව ප්‍රවේසම් විය. සුනාමිය අවස්ථාවේ ආධාර දීමේ මුවාවෙන් පැමිණ දීඝවාපියේ ඉඩම් මුස්ලිම් ජනයාට නිවාස තැනීමට දුන් ආකාරය අපි දනිමු. එහි දී ප්‍රාදේශීය සභා සාමාජිකයකු ද ඇතුළු තවත් දේශප්‍රේමීන් කිහිප දෙනකු ශ්‍රේෂ්ඨාධිකරණයට ගොස් ඒ නැවැත්වීමට කටයුතු නොකරන්නට ඉන් තවත් ප්‍රශ්නයකට මුළ පිරීමට ඉඩ තිබුණි. ඒ නඩු තීන්දුවට කිසිම උරුමයක් නැති දේශපාලන පක්ෂයක් ඒ උරුම කරගැනීමට කටයුතුකිරීම පුගුප්සාජනක බව පමණක් සඳහන් කරමි.

බටහිරයන්ට එරෙහිව තදින් සිටින්නේ නම් මොන සංකල්ප පදනම් කරගෙන පැමිණිය ද ඔවුන්ගේ බහුබූත සංකල්පවල ව්‍යාජත්වය හෙළිදරවු කරමින් ඔවුන් අකර්මන්‍ය කළ හැකි ය. පසුගිය වකවානුවේ බටහිරයන්ට හා ඉන්දියාවට අවශ්‍ය ආකාරයට කටයුතුකිරීමට විවිධ ආණ්ඩු පෙළගැසීම හේතුවෙන් අපට කොටි පරාජය කිරීමට නො හැකි විය. මහින්ද රාජපක්ෂ මහතාගේ දේශපාලන නායකත්වයෙන් ඊනියා නාග රාජයන් ගැරඩින් ලෙස නිවැරදිව හඳුනාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස අද වීරෝදාර හමුදාවන්ට කොටින්ට එළව එළවා පහර දීමට හැකි වී තිබේ. සාර්ථක හමුදා මෙහෙයුම් ඉදිරියේ බටහිරයන්ට අද කර කියාගත දෙයක් නැත. 1995 පමණ වන විටත් අද ප්‍රභාකරන්ට පහර දිය යුතු යැයි කියන බොහෝ අය අපට විරුද්ධව කටයුතු කළ බව මතක් වන විට ඔවුන් වෙනස්වීම ගැන අපට සතුටක් ඇතිවනු වැළැක්විය නො හැකි ය.

අද කළ යුත්තේ කොටින්ගේ ව්‍යාජ සටන් විරාම අළුයම ලූ කෙළ පිඩක් මෙන් ඉවත දමා කොටි පරාජය කිරීමට හමුදාවට තව තවත් ධෛර්ය දීම ය. එවැනි අවස්ථාවක එක් දින වැඩ වර්ජනයක් කිරීමට ගොස් අත පුච්චා ගත් ජ වි පෙ දින තුනක වැඩ වර්ජනයක් ගැන කතා කරන්නේ නම් ඒ තවත් වැරදීමක් යැයි තීරණය කළ හැකි නො වෙයි. ජ වි පෙ ලවා හමුදා මෙහෙයුම් අඩාළ කරවීමට බටහිරයන් හෝ ඉන්දියාව හෝ වෙනත් කිසිවකු හෝ උත්සාහ දරන්නේ ද? ජ වි පෙ ගෙන යන ඉන්දියානු විරෝධය හුදෙක් ඇස් බැන්දුමක් ද?

පසුගිය දා මෙහි පැමිණි ඉන්දියානු නිලධාරීන් තිදෙනා ආණ්ඩුවට කුමක් කීවේ දැයි අපි නො දනිමු. ඔවුන්ගේ ප්‍රශ්නය අප පකිස්ථානයෙන් හා චීනයෙන් තව තවත් ආයුධ මිළ දී ගැනීම නම් අපට ඒ තේරුම්ගත හැකි ය. ඒ කුමක් වුවත් මෙරට ආණ්ඩුව කටයුතු කළ යුත්තේ  රටේ සුභ සිද්ධිය සඳහා මිස ඉන්දියාවේ හෝ බටහිර රටක හෝ අවශ්‍යතාව අනුව නො වෙයි. කොටින්ගේ ව්‍යාජ සටන් විරාමයට එකඟ වීමට කිසිවකු හෝ බල කරන්නේ නම් ඔවුන්ට කිව යුත්ත නොවළහා කීමටත් රටේ පස් පෑගීමට ඔවුන්ට ඉඩ නොදීමටත් ආණ්ඩුවට කටයුතු කළ හැකි වෙයි. අමතක නොකළ යුතු කරුණ නම් මොවුන් ගැරඩින් හා කඩදාසි කොටි පමණක් බව ය. අප රට කුඩා රටක් යන හීන මානයෙන් මිදී ක්‍රියාත්මක ව මියන්මාරය අනුගමනය කිරීමට අපි කටයුතු කරමු. සංකල්පවලින් හා දැනුමෙන් අප යටත්කිරීමට කැසකවන්නන්ට ඔවුන්ට වඩා හොඳින් ඒ භාෂාවෙන් ම පිළිතුරු දීමට  අපි දැන් සමත් වෙමු. මේ අප පසුගිය විසි වසර ඇතුළත ලබාගත් ජයග්‍රහණයක් බව නිහතමානීව ප්‍රකාශකරමු.

සටන් විරාමයක් සඳහා ආයුධ බිම තැබීමට කොටි කැමති නොවනු ඇත. එහෙත් අප මුළාකිරීම සඳහා බොරුවට ආයුධ බිම තැබීමට කොටි එකඟ කරවා ගැනීමට බටහිරයන් කටයුතු කිරීමට ඉඩ ඇත. අද බටහිරයන්ට ක්‍රියාත්මක කළ හැක්කේ එවැනි උපක්‍රම පමණකි. අප ඉන් මුළා විය යුතු නො වෙයි. කොටි ආයුධ බිම තිබ්බේ ද නැත් ද යන්න දැනගත හැක්කේ කෙසේ ද? ඒ සඳහා බටහිරයන්ගේ කොමිසමකට ආරාධනය කරමු ද? අපි ඔවුන්ගේ ඊනියා වාස්තවික අපක්ෂපාති වාර්තා පිළිගනිමු ද? දැනමෙහි ඊනියා වාස්තවිකත්වයක් නැති බව පෙන්වීම අපේ වැදගත්ම ජයග්‍රහණයකි. අද අප කළ යුත්තේ එකම එක දෙයක් පමණකි. ඒ අන්කිසිවක් නොව කොන්දේසි විරහිතව කොටින්ගේ ඊනියා සටන් විරාම ඉල්ලීම ප්‍රතික්ෂෙප කිරීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva